www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මැතිවරනය: ජෙනරාල් ෆොන්සේකාගේ කම්කරු පන්ති-විරෝධී න්‍යාය පත්‍රය

**Sri Lankan election: General Fonseka's anti-working class agenda**

**විජේ ඩයස් විසිනි**

**2010 ජනවාරි 16**

ජෙනරාල් සරත් ෆොන්සේකා ජනාධිපති අපේක්ෂකයෙකු ලෙස ඉස්මත්තට ඒම දේශපාලන සංස්ථාපිතයේ සැලකිය යුතු කොටස් රටෙහි වැඩි දියුනුවන ආර්ථික හා සමාජ අර්බුදය මධ්‍යයේ පොලිස් රාජ්‍ය පාලනයක් දිශාවට ගත් හැරීමක් බව සමාජවාදී සමානතා පක්ෂය (සසප) යලි යලිත් අනතුරු අඟවා ඇත.

දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) එකඟ වන ලද "අවම පොදු වැඩපිලිවෙලක්" වන ෆොන්සේකාගේ මැතිවරන ප්‍රකාශනය මගින් මෙම අනතුරු ඇඟවීම සනාථ කරනු ලැබ ඇත. මෙම විරුද්ධ පක්ෂ දෙක ම හිටපු යුද හමුදා ප්‍රධානියාට පිටුබලය සපයමින් ඔහුව වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂට එරෙහි ප්‍රජාතන්ත්‍රවාදී විකල්පයක් ලෙස ව්‍යාජ ලෙස ඉදිරියට දමති.

ලෝකයේ අනෙකුත් දේශපාලනඥයින් මෙන් ෆොන්සේකා එක්සත් ජනපද ජනාධිපති ඔබාමාගේ උද්ඝෝෂනය අනුකරනය කරමින් සිටී. ඔබාමාගේ පිටපතෙන් කොටසක් කඩා ගනිමින් ඔහු ඔහුගේ ප්‍රකාශනය "විශ්වාසනීය වෙනසක්" යනුවෙන් නම් කොට ඇත. "මම වෙනස් වෙමි. මම ම වෙනසකි. මම විශ්වාසනීය වෙනසක් ගෙන එන්නෙමි," යයි ඔහු ප්‍රකාශ කරයි. ඔබාමා මෙන් ම ෆොන්සේකා ද තමන්ගේ සැබෑ න්‍යාය පත්‍රය වහංගු කරමින් පවත්නා තන්ත්‍රයට එරෙහි පැතිරුනු විරුද්ධත්වයට ආමන්ත්‍රනය කරයි.

යථාර්ථයේ දී අපේක්ෂකයින් දෙදෙනා අතර අතිමූලික වෙනස්කම් නැත. රාජපක්ෂ 2006 ජූලි මාසයේ දිවයින නැවත යුද්ධයට ඇදගෙන ගිය අතර රටෙහි ප්‍රධාන ජෙනරාල් ලෙස බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) ට එරෙහි ප්‍රහාරය අනුකම්පා විරහිත ලෙස ක්‍රියාවට දැමී ය. මිලිටරියේ ඉවබව නැති බෝම්බ ප්‍රහාරවලින් සිවිල් වැසියන් දහස් ගනනක් ඝාතනය කිරීම, සිය දහස් ගනනකට නිවාස අහිමි කිරීම සහ පසුගිය මැයි මාසයේ එල්ටීටීඊයේ පරාජයෙන් පසු දෙමල වැසියන් 280,000ක් සිරගත කර තැබීමට දෙදෙනාම වගකිව යුතු ය.

ෆොන්සේකා, යුද්ධය දියත් කොට, ප්‍රජාතන්ත්‍ර අයිතීන් මැඩලා යුද්ධයේ බර කම්කරු පන්තිය මතට කඩාපාත් කල රාජපක්ෂ වටා සිටි දේශපාලන-මිලිටරි කල්ලියේ ප්‍රමුඛ සහභාගිකරුවෙක් විය. දැන් ඔහු එම තන්ත්‍රය පිලිකුල් කොට තකන විරුද්ධවාදියෙක් ලෙස ආරූඪ වන්නේ අවම වසයෙන් ගත්ත ද ඔහු සහ මිලිටරිය හවුලේ කරගෙන ගිය "අතුරු දහන් කිරීම් සහ නීතියට පරිබාහිර ඝාතන සංස්කෘතිය" හෙලා දැකීම පවා කරමිනි. ෆොන්සේකා රාජපක්ෂ සමග විරසක වූයේ ජනාධිපතිවරයා මිලිටරි බලධාරීන් පසෙකට කොට ජයග්‍රහනයේ සියලු කීර්තිය තමාට හිමි බව ප්‍රකාශ කිරීමෙන් අනතුරුවය.

"විශ්වාසනීය වෙනසක්" පිලිබඳ ෆොන්සේකාගේ පනිවුඩය මුඛ්‍ය වසයෙන් වෙනස් ශ්‍රාවකයන් දෙකොටසකට ආමන්ත්‍රනය කරයි. ප්‍රථමයෙන් ඔහු ගසාකෑමට උත්සාහ කරන්නේ සිංහල, දෙමල සහ මුස්ලිම් කම්කරු පන්තිය අතර රාජපක්ෂ තන්ත්‍රය කෙරෙහි පවත්නා මහජන වෛරය යි. ඔහු ව්‍යාජ ලෙස මවාපාන්නේ ප්‍රජාතන්ත්‍රවාදය, සාමය සහ සෞභාග්‍යය ගෙන ඒමට උපන් දැහැමි මිනිසකු ලෙස ය. හුදෙක් ආන්ඩුව පමනක් නොව සමස්ත දේශපාලන තන්ත්‍රය ම කම්කරු පන්තියේ දෑස් ඉදිරිපිට අපකීර්තියට පත් වී ඇති තතු තුල එවන් පූච්චානමක් අවශ්‍ය ය.

පුලුල්ව පැතිරුනු මහජන මනෝගතියට ආමන්ත්‍රනය කරමින් ෆොන්සේකා මෙසේ වැලපෙයි: "යුද්ධාවසානයේ ජනතාව බලාපොරොත්තු වූ සාමය උදාවී නැත. ඔවුන්ගේ බලාපොරොත්තුවලට පහර එල්ල වී තිබේ. ආර්ථිකය බිඳවැටී ඇත." සමහර ජනයාට දිනකට වේල් තුනක් කෑම උපයා ගත නො හැකි බව පිලිබඳව ද ඔහු කිඹුල් කඳුලු හෙලයි. තමන් දේශපාලනඥයෙක් නො වන බවත් දූෂිත සංස්කෘතියේ

කොටස් කාරයෙක් නො වන බවත් ඔහු අවධාරනය කරයි.

ඒ අතර ම ඔහු පාලක පන්තියට අවශ්‍ය කරන ප්‍රබල නායකයා ලෙස තමන්ව හුවා දක්වයි. "නීතිය හා සාමය බිඳවැටී ඇතැයි" ඔහු පැමිනිලි කරයි. "හමුදාවේ වසර හතලිහක අත්දැකීම් සහිත මම වෘත්තීය දේශපාලනඥයෙකු නො වෙමි. මම තීරන ගැනීමට බිය නැති නායකයෙක් වෙමි. මම පොරොන්දු වූ පරිදි තීරන ගෙන ඇත්තෙක් වෙමි"යයි ප්‍රකාශ කරන ඔහු "සාධාරන සහ විනයගරුක සමාජයක්" සඳහා පොරොන්දු වෙයි.

මේවා තර්ජනකාරී ප්‍රකාශයන් ය. අතීතයට හැරී බලන කල තියුනු වියවුල් සහගත කාලපරිච්ඡේද සැමෙකදීම පුරුද්දක් ලෙස නායකත්වයක් නොමැතිකම පිලිබඳව වැලපී ඇති කොලඹ සංස්ථාපිතය පාර්ලිමේන්තු දේශපාලනයේ පිලිකුල් සහගත ස්වභාවය විවේචනයට ලක්කොට ඇත. එවැනි අවස්ථාවල දී පාර්ලිමේන්තු පටිපාටිය සහ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් කෙරෙහි ආක්‍රමනශීලී ආකල්පයක් ගනිමින් පාලක ප්‍රභූන්ට අවශ්‍ය න්‍යාය පත්‍රයන් පටවනු ලැබිය හැකි සුදු අසුපිට නැගී එන වීරයෙක් පතා කතුවැකිකරුවන් ආයාචනා කොට ඇත.

දැන් දිවයිනේ වඩා දරුනු වන ආර්ථික හා සමාජ අර්බුදය මධ්‍යයේ කිසිදු දේශපාලන පක්ෂයකට වග නො කියන එහෙත් රාජ්‍ය තන්ත්‍රය කම්කරු පන්තියට එරෙහිව හැසිරවිය හැකි ජෙනරාල්වරයා වන ෆොන්සේකා වෙත පාලක පන්තියේ බලගතු කොටස් හැරෙමින් සිටිති. ඔහු පසුගිය බදාදා ව්‍යාපාරික නායකයින්ට කියා සිටි පරිදි "මේ අවස්ථාවේ ශ්‍රී ලංකාවට අවශ්‍ය වන්නේ විනයගත, කැපවුනු, අවංක, ඍජු සහ තද තීරනගැනීමට මැලි නො වන නායකයෙකි."

ඔහුගේ ප්‍රකාශනය තුල රට වඩ වඩා "ව්‍යාපාරික හිතවාදී" කිරීමට ෆොන්සේකා පොරොන්දු වෙයි. ව්‍යාපාරයක් ඇරඹීම, බදු ගෙවීම, ගොඩනැගීමේ බලපත් ලබාගැනීම, දේපොල ලියාපදිංචි කිරීම, නය සහතික කිරීම සහ දේශසීමා හරහා කෙරෙන වෙලඳම මනාව සංවිධිත සහ සරල කරන බව ඔහු ප්‍රකාශ කරයි. "ආයෝජක පහසුකම් වැඩි දියුනු කරගැනීමට උපකාරක වන ආකාරයට ඉහත දී ආයෝජන මන්ඩලය අනුගමනය කරන ලද එක වහලක් යටින් සියල්ල ලබාගතහැකි ඒක-ස්ථාන ව්‍යාපාරික ස්ථාන පිලිබඳ සංකල්පය" යලි හඳුන්වාදීම මගින් විදේශ ආයෝජන ඇදගනීමට ද ඔහු පොරොන්දු වෙයි.

එහෙත් ෆොන්සේකාගේ සමස්ත ආර්ථික න්‍යාය පත්‍රය වංචාවක් මත පදනම් වෙයි. එජාපය සහ ජවිපෙ මෙන් ම ඔහුගේ ප්‍රකාශනය යලි යලිත් කියා සිටින්නේ රටෙහි ආර්ථික ඛේදයන් මුලුමනින් ම රාජපක්ෂ තන්ත්‍රයේ "සිතීමට පවා නො හැකි දූෂනය, අල්ලස, ඥාති සංග්‍රහය සහ ආත්මලාභී වියදම් කිරීම" මගින් ඇති කරන ලද බවයි. එය අතුගා දැමූ විට සියල්ලන්ගේ ම ජීවන මට්ටම් වැඩි දියුනු කිරීමට ඕනෑ තරම් මුදල් තිබේ යයි ෆොන්සේකා කියා සිටී.

මෙය විශ්වාස කරන ඕනෑ ම අයෙක් මෝඩයෙකි. සාමාන්‍ය වැඩකරන ජනතාවගේ ජීවන මට්ටම් තියුනු ලෙස ඛාදනය වීමේ මූලික හේතු වන්නේ ධනේශ්වර පද්ධතිය වන අතර ශ්‍රී ලංකාවේ නම් එමගින් ජනිත ව්‍යසනකාරී 26 අවුරුදු සිවිල් යුද්ධයයි. මැතිවරනයට පසුව න්‍යාය පත්‍රයේ එනු ඇත්තේ සාමයේ සහ සෞභාග්‍යයේ නව යුගයක් නොව ජීවන කොන්දේසි මත එල්ල කෙරෙන නව දරුනු ප්‍රහාරයකි. රාජපක්ෂට ඔහුගේ යුද වියදම් පියවා ගැනීමට දිවයින මුලුමනින් ම උගසට තැබීමට සිදුවූයේ ගෙවුම් ශේෂ අර්බුදයක් වලකාගැනීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (ජාමුඅ) ඩොලර් බිලියන 2.6ක් නයට ගැනීමට සිදු කරමිනි. ඊ ලඟ ජනාධිපති ෆොන්සේකා හෝ රාජපක්ෂගෙන් කවුරු වුවත් ඔහුට ජාමුඅ කප්පාදු පියවර ක්ෂනිකව ක්‍රියාවට දැමීම ක්ෂනිකව ආරම්භ කිරීමට සිදු වනු ඇත.

ෆොන්සේකා වසර ගනනාවක් යුද නිලධාරියෙක් විය හැකි නමුත් ඔහු වහ වහා කොලඹ දේශපාලනඥයෙකුගේ භූමිකාවට අනුගත වී ඇත. රාජපක්ෂ මෙන් ම ජෙනරාල්වරයා සියලු දෙනාට හිස් පොරොන්දු දීමේ නිපුනයෙකි: පවුල්වලට මූල්‍ය ආරක්ෂාව, තරුනයන්ට රැකියා, කම්කරුවන්ට ඉහල වැටුප්, දිලින්දන්ට වැඩි සුභසාධන, ගොවියන්ට ඉහල මිල ගනන් සහ වැඩි සහනාධාර යනාදී ලෙස ලැයිස්තුව ඉදිරියට යයි. ෆොන්සේකා දන්නා පරිදි මේ පොරොන්දු කිසිවක් ඉටු කල නො හැක.

ජෙනරාල්වරයා ඔහුගේ හමුදාව විසින් කෲර ලෙස බෝම්බ දමා, වධ බන්ධනයට ලක්කොට සිරගත කරන ලද දෙමල සුලුතරය සමග "ජාතික එකමුතුවක්" අරඹන බවට ද පොරොන්දු වෙයි. පසුගිය 60 වසර තිස්සේ කොලඹ දේශපාලන සංස්ථාපිතය කම්කරු පන්තිය බෙදීමේ මූලික ආයුධය ලෙස යොදා ගෙන ඇත්තේ දෙමල විරෝධී ප්‍රජාගනවාදයයි. නිල වෙනස්කම් කිරීම 1983 සිවිල් යුද්ධයක මට්ටමට නැගුනි. මෙතෙක් යම් හෝ "එකමුතුවක්" සිදු වී ඇත්නම් එයින් සිදු කෙරී ඇත්තේ දෙමල ප්‍රභූ තන්ත්‍රය යොදා ගනිමින් දෙමල මහජනතාව හීලෑකොට ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට දිගටම ප්‍රහාර එල්ල කිරීමයි.

ෆොන්සේකා ඉටු කරන එකම පොරොන්දුව වනු ඇත්තේ "සන්නද්ධ හමුදා නවීකරනය කිරීම" යි. ඔහු ජනාධිපති ධුරය ජයග්‍රහනය කලහොත් දේශපාලන විරුද්ධත්වය මර්දනය කිරීම සඳහා පොලීසියත් සමග

යොදා ගත හැකි උපකරනය ලෙස ද තම සහයෝගී පදනම ලෙස ද මිලිටරිය මත රැඳීමට ඔහුට බලකෙරෙනු ඇත.

මෙමගින් පෙන්නුම් කෙරෙන්නේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට, පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීමට හා ප්‍රජාතන්ත්‍ර අයිතීන් ප්‍රතිස්ථාපනය කිරීමට ෆොන්සේකා දෙන පොරොන්දු මහා වංචාවක් බවයි. තමන්ගේ ප්‍රථම පියවරයන් ලෙස ජෙනරාල්වරයා පොරොන්දු වන්නේ සියලු පක්ෂවල භාරකාර කැබිනට්ටුවක් තැනීම, හදිසි නීති රෙගුලාසි සංශෝධනය (අහෝසි කිරීම නො වේ) කිරීම, පාර්ලිමේන්තුව විසුරුවාහැරීම සහ නව මැතිවරනයක් කැඳවුම් කිරීමයි.

ෆොන්සේකා ජනාධිපතිධුරය ජයගතහොත් ඔහු නව ඒකාධිපතියෙක් මිස ප්‍රජාතන්ත්‍රවාදියෙකු නො වනු ඇත. විධායක ජනාධිපති ධුරය අහෝසි කරනු වෙනුවට එම තනතුරේ දුරදිග යන බලතල මින් පෙර කිසිදු ජනාධිපතිවරයෙකුටත් වැඩියෙන් පාවිච්චි කිරීමට ඔහුට බලකෙරෙනු ඇත. තමන්ගේ ම සහයෝගී පදනමක් නොමැති ඔහුට ආඥා පැනවීමට, ඇමතිවරුන් සහ ආන්ඩු පහකිරීමට රටෙහි දිගට ම පවතින හදිසි තත්වය යටතේ රාජ්‍ය තන්ත්‍රය බලමුලුගැන්වීමට පවතින හැකියාව මත පදනම් වීමට බලකෙරෙනු ඇත. පාලක ප්‍රභූවේ කොටස් ඔවුන්ගේ න්‍යාය පත්‍රය ක්‍රියාවට දැමීමට ඔහුට පිටුබලය සපයන හේතුව ද එය ම ය.

තවත් එක් කරුනක් අවසන් වසයෙන් එක් කල යුතු ය. එනම් ෆොන්සේකා රාජ්‍යතාන්ත්‍රිකත්වයේ සැලකිය යුතු මාරුවකට ද සංඥා කරමින් සිටින බවයි. ව්‍යාපාරික නායකයන් සමග ඔහු කල සාකච්ඡාවේ දී "ජාත්‍යන්තර ප්‍රජාවේ හොඳහිත" විනාශ කිරීම ගැන ඔහු රාජපක්ෂට චෝදනා නැගී ය. "ජීඑස්පී ප්ලස් බදු සහනය වරදවා හැසිරවූ තකතීරු ආකාරය" පිලිබඳව ද ඔහු සිය ප්‍රතිමල්ලවයාව විවේචනය කලේ ය. ජීඑස්පී යනු රෙදිපිලි ද ඇතුලත් ශ්‍රී ලංකා අපනයනවලට දෙනු ලබන බදු සහනයක් වන අතර චෝදිත මානව හිමිකම් උල්ලංඝනය කිරීම් හුවා දක්වමින් යුරෝපීය ජාතීහු එය අත්හිටවූහ.

"ජාත්‍යන්තර ප්‍රජාව" ගැන කථාකරන විට ෆොන්සේකා ඉන් අදහස් කරන්නේ රාජ්‍ය තාන්ත්‍රික සහයෝගය, මිලිටරි වෙලඳම් සහ මූල්‍ය ආධාර සඳහා රාජපක්ෂ රැඳීගත් චීනය නොව එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය යි. කොලඹ මත දේශපාලන බලපෑම යෙදීමේ උපක්‍රමයක් ලෙස එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය රාජපක්ෂගේ යුද අපරාධ සහ ප්‍රජාතාන්ත්‍රික අයිතීන්  කෙලෙසීම පිලිබඳ සීමිත විවේචන කලහ. රාජපක්ෂ එයට ප්‍රතිචාර දැක්වූයේ ශ්‍රී ලංකාවට එරෙහි "ජාත්‍යන්තර කුමන්ත්‍රනයක්" පවතින බව පවසමින් වඩ වඩා චීනය මත රැඳෙමිනි. සියල්ලට ඉහලින් ෆොන්සේකා වොෂින්ටනයට පෙන්නුම් කරමින් සිටින්නේ ශ්‍රී ලංකාව වඩා අචල ලෙස එක්සත් ජනපද කඳවුරට යලි රැගෙන එන බවයි.

ෆොන්සේකා හෝ රාජපක්ෂගෙන් කිසිවෙක් කම්කරු පන්තියේ අවශ්‍යතා නියෝජනය නො කරති. සසප යලිත් අනතුරු අඟවා සිටින්නේ ඊ ලඟ ආන්ඩුව රාජපක්ෂ "ආර්ථික යුද්ධය" යයි විස්තර කර ඇති දෙය කම්කරු පන්තියට එරෙහිව හැල්මේ ක්‍රියාවට දමනු ඇති බවයි. සසප සහ එහි අපේක්ෂක විජේ ඩයස් මේ මැතිවරනයේ දී උද්ඝෝෂනය කරමින් සිටින්නේ සමාජවාදී පිලිවෙත් මත පදනම් වූ කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා කරන අරගලය තුල සිය ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කරගැනීමට කම්කරුවන් හා තරුනයන් බලමුලුගැන්වීම අරඹනු වස් ඔවුන්ව අධ්‍යාපන ගතකර ගැනීම සඳහායි.

© www.wsws.org